පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව

විෂය - නර්තනය

ශ්‍රේණිය - 13

සතිය - 23

Prepared by – M.B.I.G. Kumari
R/Sumana Balika Vidyalaya

Weekly School Department of Education,Sabaragamuwa Province/

නිපුණතාව 03 : සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩවල ස්වරූපය හඳුනා ගනිමින් වාද්‍ය කුසලතා ප්‍රදර්ශනය කරයි.
නිපුණතා මට්ටම 3.1 : වන්නම් ගායනය කරමින් බෙර වාදනය කරයි.
ක්‍රියාකාරකම 3.1 : ගායනය සමඟ වාදනය කිරීමට හුරු වෙමු. (උඩරට )

- **<u>නිවැරදි පිළිතුරු තෝරන්න.</u>**

1. ආධුනික බෙර වාදන ශිල්පියෙකු විසින් නිවැරදිව වාදනය කිරීමට පුහුණු විය යුතු ගර්භාක්ෂර ගණන,
   (i). හතරකි (ii). තුනකි (iii). හයකි (iv). අටකි

2. උඩරට බෙරයෙන් වාදනය වන සතර බීජාක්ෂර වන්නේ .
   (i). තත්, ජිත් , දොං, නං (ii). දිත්, තත්, ජිත්, තං (iii). තත් ජිත් තොං නං (iv). තත් දිත් තොං නං

3. උඩරට බෙරයෙන් මූලික අක්ෂර වාදනය කිරීමේ දී .
   (i). දකුණු බෙර ඇසින් තත් හා ජිත් - වම් බෙර ඇසින් තොං හා නං වාදනය කරයි
   (ii). දකුණු බෙර ඇසින් ජිත් හා නං - වම් බෙර ඇසින් තත් හා තොං වාදනය කරයි
   (iii). දකුණු බෙර ඇසින් තත් හා නං - වම් බෙර ඇසින් ජිත් හා තොං වාදනය කරයි
   (iv). දකුණු බෙර ඇසින් තත් හා තොං - වම් බෙර ඇසින් ජිත් හා නං වාදනය කරයි

4. සුරපති වන්නම ගායනය සමඟ වාදනය පුහුණුවීමේ දී පළමුවෙන් ම කළ යුත්තේ,
   (i). වන්නමේ කවිය තාල තබමින් නිවැරදි තාල රූපයට ගායනා කිරීමට හුරුවීම
   (ii). වන්නමට අදාළ මූලික බෙර පදය අභ්‍යාසය
   (iii). වන්නමේ අඩව්ව පළමුව වාදනය කිරීමට හුරුවීම
   (iv). කස්තිරම හා අඩව්ව වාදනය කිරීම

5. වන්නමට අදාළව බෙර වාදනය කිරීම පුහුණුවීමේ දී පළමුවෙන් ම වාදනය කළ යුත්තේ,
   (i). සරඹ පදය (ii). මූලික බෙර පදය (iii). අලංකාර මාත්‍රා (iv). කස්තිරම , සීරුමාරුව හා අඩව්ව

- **<u>හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු යොදන්න .</u>**

6. වන්නම,ගායනය සමඟ බෙර වාදනයේ දී ....................................පාලනය පිළිබඳ විශේෂ අවධානය යොමු කළ යුතුය.

7. ගායනය සමඟ වාදනයේ දී තාලය හා ..........................................නිසි පරිදි පවත්වා ගැනීමත් ........................................

   අක්ෂර පැහැදිලි ලෙස වාදනය කිරීමත් වැදගත් වේ.

8. වාදන ශිල්පියෙකු විසින් කස්තිරම, සීරු මාරුව හා අඩව්ව වාදනය කළ යුත්තේ හඬ ....................................... වන පරිදිය.

9. ආධුනික බෙර වාදන ශිල්පියෙකු විසින් වාදනය කළ යුතු මූලික බෙර සරඹ............................................කි.

10. ගැට බෙරයෙහි වම් තට්ටුවේ ද්වනිය මතු කර ගැනීමේ ස්වභාවය...........................................නමින් හඳුන්වයි.

- **<u>සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.</u>**

11. ආධුනික බෙර වාදන ශිල්පියෙකු විසින් වන්නමක් ගායන කරමින් වාදනය කිරීමට හැකියාව ඇති කර ගැනීමට කළ යුතු අභ්‍යාසයන් මොනවා ද?
12. වන්නමට අදාළ කොටස් නිවැරදි ව ප්‍රස්තාර ගත කරන්න.
13. නිවැරදි ශිල්ප ක්‍රම භාවිත කරමින් වන්නමට අදාළ මූලික බෙර පදය හා අලංකාර පද වාදනය කරන්න.
14. වන්නමට අදාළ මූලික බෙර පදය හා අලංකාර පද ගායනය ද සමඟ වාදනය කරන්න.